# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,986 — 1962 මාර්තු 16 වැනි සිකුරාද — 1962.3.16

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස—ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | | | පිට |
|---|---|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් :— | | | |
| ප්‍රාරම්භක දැන්වීම් | ... | ... | — |
| අවසාන නියෝග | ... | ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම :— | | | |
| බස්නාහිර පළාත | ... | ... | — |
| මධ්‍යම පළාත | ... | ... | — |
| දකුණු පළාත | ... | ... | — |
| උතුරු පළාත | ... | ... | — |
| නැගෙනහිර පළාත | ... | ... | — |
| වයඹ පළාත | ... | ... | — |
| උතුරු මැද පළාත | ... | ... | — |
| ඌව පළාත | ... | ... | — |
| සබරගමු පළාත | ... | ... | — |

| | | | පිට |
|---|---|---|---|
| ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම:— | | | |
| බස්නාහිර පළාත | ... | ... | — |
| මධ්‍යම පළාත | ... | ... | — |
| දකුණු පළාත | ... | ... | — |
| උතුරු පළාත | ... | ... | — |
| නැගෙනහිර පළාත | ... | ... | — |
| වයඹ පළාත | ... | ... | — |
| උතුරු මැද පළාත | ... | ... | — |
| ඌව පළාත | ... | ... | — |
| සබරගමු පළාත | ... | ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් | | ... | 129 |
| ඉඩම් සංවර්ධන ආඥපනත යටතේ දැන්වීම් | | ... | — |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් | | ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් | | ... | 134 |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම | | ... | — |


## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

36 වෙනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ ආඥව

1962කේ අංක 35 දරන ආඥව

ජේ 59/60 එල් ජී 729

යොමු අංකය.:—

ඇල් ඒ 3803 (ඞී—ජීඅයි 269/2)

1954 අංක 39 දරන ඉඩම් අත් කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත් කර ගැනීමේ පනතේ 36 වෙනි වගන්තියෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ආණ්ඩුවේ දිසාපතිට, ආණ්ඩුවේ උප දිසාපතිට නැතහොත් එකී ආණ්ඩුවේ දිසාපති හෝ ආණ්ඩුවේ උප දිසාපති හෝ විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දැක්වෙන නියමිත ඉඩම, ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

කොළඹ, 1962 පෙබරවාරි 12 දින.

---

සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුද පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

---

## උපලේඛනය

| I | II |
|---|---|
| **ආණ්ඩුවේ දිසාපති, ආණ්ඩුවේ උප දිසාපති නැතහොත් බලයලත් වෙනත් නිලධාරියා** | **ඉඩමේ විස්තරය** |
| පුත්තලම දිස්ත්‍රික්කයේ උප දිසාපති හෝ ඔහුගෙන් බලයලත් වෙනත් නිලධාරියා. | හලාවත දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරිතැනගේ කොට්ඨාශයේ, ගල්අමුණ සහ මූට්ටිබැදිවිල යන ගම්මුලාදැනි කොට්ඨාශයන්හි ගල්අමුණ සහ මූට්ටිබැදිවිල යන ගම්වල පිහිටි, කෝන්ගහහේන, කල්ලිමුල්ල වත්ත සහ පැණිහැලියගම වත්ත නොහොත් වෙල්ලන්ගිරිය වත්ත නමැති මුළු ප්‍රමාණය අඩි 1,574 × අඩි 18 පමණ වූ ඉඩම් කැබලි 5 කට මායිම් :—<br><br>**1. කෝන්ගහහේන : ප්‍රමාණය අඩි 384 × අඩි 9 පමණ ඇත.**<br><br>උතුරට : ගල්අමුණ මිනිපිටිය ගම්සභා පාර ; නැගෙනහිරට : ජී. ඒ. මානෙල්හාමි හිමිකම් කියන කෝන්ගහහේන නමැති ඉඩම සහ ඩබ්ලිව්. ඒ. මැන්ඩිස් හිමිකම් කියන කෝන්ගහහේන නමැති ඉඩම ; දකුණට : කේ. නැලෝ ද සිල්වා හිමිකම් කියන පැණිහැලියගමවත්ත නොහොත් වෙල්ලන්ගිරියවත්ත ; බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස.<br><br>**2. කෝන්ගහහේන : ප්‍රමාණය අඩි 222 × අඩි 9 පමණ ඇත.**<br><br>උතුරට : ගල් අමුණ මිනිපිටිය ගම්සභා පාර ; නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ; දකුණට : ඩබ්ලිව්. ඒ. මැන්ඩිස් හිමිකම් කියන කෝන්ගහහේන නමැති ඉඩම ; බස්නාහිරට : එඩ්මන් විජේසිංහ හිමිකම් කියන කෝන්ගහහේන නමැති ඉඩම.<br><br>**3. කෝන්ගහහේන : ප්‍රමාණය අඩි 162 × අඩි 9 පමණ ඇත.**<br><br>උතුරට : ජී. ඒ. මානෙල්හාමි හිමිකම් කියන කෝන්ගහහේන නමැති ඉඩම ; නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ; දකුණට : එච්. ආර්. ප්‍රනාන්දු හිමිකම් කියන කල්ලිමුල්ල වත්ත නැමති ඉඩම ; බස්නාහිරට : එඩ්මන් විජේසිංහ හිමිකම් කියන කෝන්ගහහේන නමැති ඉඩම.<br><br>**4. කල්ලිමුල්ල වත්ත : ප්‍රමාණය අඩි 1,190 × අඩි 9 පමණ ඇත.**<br><br>උතුරට : ඩබ්ලිව්. ඒ. මැන්ඩිස් හිමිකම් කියන කෝන්ගහහේන නමැති ඉඩම ; නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ; දකුණට : වලහපිටිය-වඳුරඑබ ප්‍රසිද්ධ පාර ; බස්නාහිරට : කේ. නැලෝ ද සිල්වා හිමිකම් කියන පැණිහැලියගම වත්ත නොහොත් වෙල්ලන්ගිරිය වත්ත නමැති ඉඩම.<br><br>**5. පැණිහැලියගම වත්ත නොහොත් වෙල්ලන්ගිරිය වත්ත : ප්‍රමාණය අඩි 1,190 × අඩි 9 පමණ ඇත.**<br><br>උතුරට : එඩ්මන් විජේසිංහ හිමිකම් කියන කෝන්ගහහේන නමැති ඉඩම ; නැගෙනහිරට : එච්. ආර්. ප්‍රනාන්දු හිමිකම් කියන කල්ලිමුල්ල වත්ත නමැති ඉඩම ; දකුණට : වලහපිටිය වඳුරඑබ ප්‍රසිද්ධ පාර ; බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස. |

3-546

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

**36 වෙනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ ආඥාව**

1962කේ අංක 36 දරන ආඥාව

ජේ. 59/60 එස්. 587/ඇල්ඩී/ඩී 65

යොමු අංකය :—

(ජී—ඒසීකිව්/බී/99)

1954 අංක 39 දරන ඉඩම් අත් කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 36 වෙනි වගන්තියෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ආණ්ඩුවේ දිසාපතිට, ආණ්ඩුවේ උප දිසාපතිට නැතහොත් එකී ආණ්ඩුවේ දිසාපති හෝ ආණ්ඩුවේ උප දිසාපති හෝ විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දැක්වෙන නියමිත ඉඩම, ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා

කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

කොළඹ, 1962 පෙබරවාරි 12 දින.

### උපලේඛනය

| I | II |
|---|---|
| **ආණ්ඩුවේ දිසාපති, ආණ්ඩුවේ උප දිසාපති නැතහොත් බලයලත් වෙනත් නිලධාරියා** | **ඉඩමේ විස්තරය** |
| මහනුවර දිස්ත්‍රික්කයේ උප දිසාපති හෝ ඔහුගෙන් බලයලත් වෙනත් නිලධාරියා. | මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර සහ පාත හේවාහැට ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ තල්වත්ත වසමේ අරුප්පොල ගමේ පිහිටි අරුප්පොල වත්ත නමැති ඉඩමෙන් අක්කර 10ක් පමණ ප්‍රමාණය ඇති බිම් කොටසට මායිම් :—<br><br>උතුරට : දේවාලවත්ත සහ වත්තේ පාර ; නැගෙනහිරට : අරුප්පොල ජාතික නිවාස ක්‍රමයේ ඉඩමේ කොටසක් (පී. පී. ඒ. 2,093) සහ සී. අමිත් අයිතිකම් කියන මැද අමුණ නොහොත් තිහරුවේ කුඹුරු සහ ඇල පාර ; දකුණට : ලේඩි ඇන්ඩර්සන් පාර සහ ඇල, ; බස්නාහිරට : දේවාල වත්ත. |

3-547

---

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

**36 වෙනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ ආඥාව**

1962 අංක 53 දරන ආඥාව

ජේ 60/61 එල් ජී 168.

යොමු අංකය :—

කිව් ඒ 690 (ඩී-ජීඅයි 11/3).

1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කරං ගැනීමේ පනතේ 36 වෙනි වගන්තියෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, කෘෂිකම්, ඉඩම්, වාරිමාගී හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ආණ්ඩුවේ දිසාපතිට, ආණ්ඩුවේ උප දිසාපතිට නැතහොත් එකී ආණ්ඩුවේ දිසාපති හෝ ආණ්ඩුවේ උප දිසාපති හෝ විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දැක්වෙන නියමිත ඉඩම, සවාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,

කෘෂිකම්, ඉඩම්, වාරිමාගී හා විදුලිබල ඇමති.

කොළඹ, 1962 පෙබරවාරි මස 14 දින.

උපලේඛනය

| I | II |
|---|---|
| **ආණ්ඩුවේ දිසාපති, ආණ්ඩුවේ උප දිසාපති නැතහොත් බලයලත් වෙනත් නිලධාරියා** | **ඉඩමේ විස්තරය** |
| කොළඹ දිස්ත්‍රික්කයේ අතිරේක දිසාපති හෝ ඔහු ගෙන් බලය ලත් වෙනත් නිලධාරියා | කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු අළුත් කුරු කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ඉහළගම ගම් මුලාදැනි වසමේ ඉහළගම ගමේ පිහිටි කොස්ගහකුඹුර නමැති ඉඩමෙන් අ. 0, රූ. 0, පර්. 16.87 ක් පමණ ප්‍රමාණය ඇති බිම් කොටසට මායිම්: උතුරට: ඒ. ඒ. චාර්ලස් අප්පුහාමි සහ තවත් අයෙක් අයිතිකම් කියන දෙල්ගහවත්ත සහ ගම්කාර්ය සභා පාර; නැගෙනහිරට සහ බස්නාහිරට: එම කුඹුරේ ඉතිරි කොටසක්; දකුණට: කේ. ඒ. පීරිස් අප්පුහාමි සහ තවත් අයෙක් අයිතිකම් කියන මීගහවත්ත සහ ගම්සභා පාර. |

3-544

---

**1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත**

**36 වෙනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ ආඥාව**

1962 අංක 55 දරන ආඥාව

යොමු අංකය: ජේ 59/60 එල් 779/ඇල්ඒ/ඇම්. 6.

1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 36 වෙනි වගන්තියෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ආණ්ඩුවේ දිසාපතිට, ආණ්ඩුවේ උප දිසාපතිට නැතහොත් එකී ආණ්ඩුවේ දිසාපති හෝ ආණ්ඩුවේ උප දිසාපති හෝ විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දක්වෙන නියමිත ඉඩම, සවාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

කොළඹ, 1962 පෙබරවාරි මස 19 දින.

උපලේඛනය

| I | II |
|---|---|
| **ආණ්ඩුවේ දිසාපති, ආණ්ඩුවේ උප දිසාපති නැතහොත් බලයලත් වෙනත් නිලධාරියා** | **ඉඩමේ විස්තරය** |
| දිස්ත්‍රික් ඉඩම් නිලධාරි, කෑගල්ල දිස්ත්‍රික්කය හෝ ඔහුගෙන් බලයලත් වෙනත් නිලධාරියා | කෑගල්ල දිස්ත්‍රික්කයේ අටුලුගම සහ පනාවල් කෝරළේ, මාගම්මන වසමේ අටුලුගම ගමේ පිහිටි පහලගොඩ කුඹුර නමැති ඉඩමෙන් පර්චස් 2.3 ක් විශාල වූ බිම් කොටසට මායිම්: උතුරට: පහලගොඩ කුඹුර; නැගෙනහිරට: පහලගොඩ කුඹුරේ ඉතිරි කොටස සහ එහි වනාත; දකුණට: කන්දේ ඇල නොහොත් අටුලුගම් ඇල; බස්නාහිරට: පහලගොඩ කුඹුරේ වනාත. |

3-545

---

**1954රේ අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධනය) පනතින් සංශෝධිත 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනත**

1954රේ අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධනය) පනතින් සංශෝධිත 1950 හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 36 වෙනි වගන්තියෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමති, චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ 3 වැනි තීරයේ සඳහන් ඉඩම් අත්කරගන්නා නිලධාරි හෝ ඔහු විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ 4 වෙනි තීරයේ අනුරූප සටහනේ දක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියෝග කරමි.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති.

1962 මාර්තු මස 2වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

| 1 වැනි තීරය<br>යොමු අංකය | 2 වැනි තීරය<br>1962කේ<br>ආඥා අංකය | 3 වැනි තීරය<br>ඉඩම් අත්කර ගන්නා නිලධාරි | 4 වැනි තීරය<br>ඉඩමේ විස්තර |
|---|---|---|---|
| ජේ 58/59 ඊ 398—3/63/74 ... | 71 | ... උප දිසාපති, කුරුණෑගල දිස්ත්‍රික්කය ... | අංක 1648 අවසාන ගම් සිතියමේ අතිරේක 5 අංක 142, 143, 144, 145 හා 146 දරණ බිම් කැබලි. |
| ජේ /5859 ඊ 326—ඇල් ඩී/ඒ/52 ... | 72 | ... උප දිසාපති, මහනුවර දිස්ත්‍රික්කය... | අංක ඒ 2,815 මූලික සැලැස්මේ අංක 1 හා 2 දරණ බිම් කැබලි |
| ජේ 56 ඇල් ජී 13—කිව් බී 221 ... | 73 | ... අතිරේක උප දිසාපති, කොළඹ දිස්ත්‍රික්කය ... | අංක ඒ 4,593 මූලික සැලැස්මේ අංක 1, 2, 3 හා 4 දරණ බිම් කැබලි |
| ජේ 57 ඊ 43—ඇල් ඒ/එෆ්ජ්/7578 ... | 74 | ... උප දිසාපති, හම්බන්තොට දිස්ත්‍රික්කය ... | අංක 306 අවසාන ගම් සිතියමේ අතිරේක 3 අංක 211 හා 212 දරණ බිම් කැබලි |
| ජේ 54 ඇල් 241—ඇල් ආර් 1439 ... | 75 | ... දිස්ත්‍රික් ඉඩම් නිලධාරි, අනුරාධපුර දිස්ත්‍රික්කය ... | අංක ඒ 140 මූලික සැලැස්මේ අංක 1 දරණ බිම් කැබැල්ල |
| ජේ 58/59 ඊ 469—ඇල් එච්/සී/17/59 ... | 76 | ... උප දිසාපති, කළුතර දිස්ත්‍රික්කය ... | අංක ඒ 1,820 මූලික සැලැස්මේ අංක 1 හා 2 දරණ බිම් කැබලි |
| ජේ 58/59 ඊ 636—කිව්/සී/56 ... | 77 | ... දිස්ත්‍රික් ඉඩම් නිලධාරි, කොළඹ දිස්ත්‍රික්කය | අංක ඒ 4,700 මූලික සැලැස්මේ අංකය 1 දරණ බිම් කැබැල්ල |
| ජේ 57/58 ඇල් ජී 391—3/62/100 ... | 78 | ... උප දිසාපති, කුරුණෑගල දිස්ත්‍රික්කය ... | අංක ඒ 1,610 මූලික සැලැස්මේ අංක 1, 2, 3 සහ 4 දරණ බිම් කැබලි |
| ජේ 56 ඇල් 101—ඇල් එච්/බී 111 ... | 79 | ... උප දිසාපති, කළුතර දිස්ත්‍රික්කය ... | අංක 127 අවසාන ගම් සිතියමේ අතිරේක 3 අංක 725, 726, 727, 728, 730, 731, 732, 733, 734, 736, 737, 738, 739, 740, 742, 743, 747, 748 හා 749 දරණ බිම් කැබලි |
| ජේ 58/59 ඩබ්/830—එල් එම් 5817 ... | 80 | ... දිස්ත්‍රික් ඉඩම් නිලධාරි, කෑගල්ල දිස්ත්‍රික්කය ... | අංක 27 දරණ ටෝපෝ මැනුම් සැලැස්මේ උඩෘත 10යේ අංක 1, 2, 3 හා 4 දරණ බිම් කැබලි |
| ජේ 59/60 එල් 174(වි.ඊ)—කිව් ඕ 61/කිව් 592 ... | 81 | ... උප දිසාපති, කොළඹ දිස්ත්‍රික්කය... | අංක ඒ 4,733 මූලික සැලැස්මේ අංක 1, 2 හා 3 දරණ බිම් කැබලි |

### 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනත

5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, කොළඹ නාගරිකයේ අංක 30 දරණ බොරැල්ල කොට්ඨාශයේ මොඩල් ෆාම් පාරේ වරිපනම් අංක 151/30-32 දක්වා දරණ පර්චස් 9ක් පමණ ප්‍රමාණය ඇති බිම් කොටසට මායිම් :—

උතුරට සහ නැගෙනහිරට : මොඩල් ෆාම් පාරේ වරිපනම් අංක 151/1 දරණ ඉඩම (අත්කර ගැනීමට යෝජිත) ; දකුණට : ගාමිනී කොරයා මහත්මී අයිතිකම් කියන මොඩල් ෆාම් පාරේ වරිපනම් අංක 171 දරණ ස්ථානය ; බස්නාහිරට : මොඩල් ෆාම් පාර.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක ජේ. 60/61 ඇස් 354 ; ආර්/කිව් 344.

1962 පෙබරවාරි මස 19 දින කොළඹ දී ය.

3-536

---

### 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑ කෝරලේ (මැදපත්තුවේ) ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, අළුත්ගම-බෝගමුවේ පිහිටි කිනිගහලන්ද නමැති ඉඩමෙන්, පහත සඳහන් මායිම් තුළ පිහිටි, අක්කර 12ක් පමණ විශාල ඉඩම් කොටසක් :—

උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ; නැගෙනහිරට : කේ. ඩී. ගෝමිස් පීටර් සහ තව අය අයිතිකම් කියන පන්විල ; දකුණට : ඒ. 4,406 මු. පිඹුරේ විස්තර කරන සුසාන භූමියට යන පාර ; බස්නාහිරට : කොළඹ-නුවර මහපාර.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක ජේ 60/61 එල් 463 (වී. ඊ)/කෘෂ. ඞී 69.

1962 මාර්තු 1 දින කොළඹ දිය.

3-383

---

### 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, කහවල පිහිටි ප්‍රමාණයෙන් අක්කර 1ක් පමණ වූ අළුබෝගහවත්ත නමැති ඉඩම් කොටසට මායිම් :—

උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස ; නැගෙනහිරට : කො/කහවල රජයේ මිශ්‍ර පාසල් භූමිය (රජයසතු) ; දකුණට : ඩී. ජේ. වික්‍රමනායක හිමිකම් කියන අළුබෝගහවත්ත ; බස්නාහිරට : ඩී. ජේ. වික්‍රමනායක හා තවත් අය හිමිකම් කියන කුන්දකැටිය කුඹුරු.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක : ජේ. 59/60ඊ 707/කෘෂ. ඞී. 449/කිෂූ ඊ138

1962 ජනවාරි මස 17 වන දින කොළඹ දී ය.

3-420

---

### 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥා පනතින් සංශොධිත 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම මහජන කාය්‍යියක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පන්තේ විධිවිධාන යටතේ එය අත්කරගනු ලැබේ යයි ද කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල අමාත්‍ය චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිත, 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි :—

මහනුවර දිස්ත්‍රික්කයේ, උඩ පලාත ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ දොළුව වසමේ මැද පිටිය ගමේ පිහිටි වැලිකැටියේ හේන නමැති ඉඩමෙන් අක්කර 2, රූඩ් 0, පර්චස් 0. ක් පමණ ප්‍රමාණය ඇති බිම් කොටසට මායිම් :—

උතුරට : ජී. ජී. මුතුමැණිකේ සහ තවත් අය අයිතිකම් කියන වැලිකැටියේ හේන ; නැගෙනහිරට : ප්‍රසිඩ පාර ; දකුණට : කිරි අප්පුගේ වත්ත, වැලිකැටියේ හේන සහ දොඹමගහ වැල්ලේ හේන නොහොත් වැලිකැටියේ හේන ; බස්නාහිරට : ආර්. ඇම්. රම්මැණිකේ අයිතිකම් කියන වෙලන්ගිරියේ වෙල් ඇල සහ වෙලන්ගිරියේ කුඹුර.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම් වාරිමාර්ග හා විදුලිබල ඇමති.

සඳහන් අංකය : ජේ 59/60 එස් 884-ඇල්ඞී/ඞී. 47

1962 පෙබරවාරි මස 20 දින,
කොළඹදීය.

3-597

---

### 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, බූටාවත්ත වසමේ බූටාවත්ත ගමේ පිහිටි ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, ප. 05.6 ක් පමණ වූ පාරක් වන නිකතැන්න වත්ත නමැති පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කැබැල්ල.

උතුරට : ගම්සභා පාර ; නැගෙනහිරට : ඇස්. කේ. මරදපිල්ලේ හිමිකම් කියන නික්කැන්න වත්ත ; දකුණට : පින්නගොල්ල වෙන්ඩිමලේ සහ ගල්කඹුල්ල නමැති ඉඩම ; බටහිරට : ආර්. ඇම්. නාරායනසාමි හිමිකම් කියන පින්නගොල්ල වත්ත.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක : ජේ. 58/59 එල්. 876 (වීඊ.)

1962 ජනවාරි මස 25 දින කොළඹ දිය.

3-424

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, දම්බරාව ගම්මුලාදෑනි වසමේ, දම්බරාව පහලගම්මැද්දේ පිහිටි උයන්වත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අක්කර 24 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස (බංගලාව අත්හැරය) :

උතුරට : උඩුගොඩ බණ්ඩාර ඇළ ; නැගෙනහිරට : මෙම ඉඩමේම කොටසක් ; දකුණට ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ පාර ; බටහිරට : වයි. ඇම්. ඩිංගිරි බණ්ඩා හිමිකම් කියන තිත්තවෙලඅග නමැති ඉඩම, ජී. කේ. මුතුබණ්ඩා හිමිකම් කියන උයන්වත්ත නමැති ඉඩම සහ උඩුගොඩ බණ්ඩාර ඇළ.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක ජේ. 58/59 එල් 460 (වීඊ)

1962 ජනවාරි මස 16 දින කොළඹ දී ය.

3-423

---

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

හලාවත දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරලේ, කලුඅච්චිමුල්ල ගම්මුලාදෑනි වසමේ සිංගන්කුලිය ගමේ පිහිටි අ. 4, රූ. 2, ප. 08ක් පමණ ප්‍රමාණය ඇති මොරකැලේ නමැති ඉඩමට මායිම් :—

උතුරට : දන්කොටුව-පන්නල පාර ; නැගෙනහිරට සහ දකුණට : නැසීගිය තෝරිස් ප්‍රනාන්දුගේ උරුමක්කාරයින් අයිතිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස ; බස්නාහිරට : ආර්. ඒ. ඒමිස් අප්පුහාමි සහ තවත් අය අයිතිකම් කියන දෙල්ගහ හේන නමැති ඉඩම.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය : ජේ 60/61 එස් 520—ඇල් ඒ ජී 384.

1962 පෙබරවාරි මස 12 වන දින කොළඹදීය.

3-422

---

## 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

යොමු අංකය. ආර්/කිව්. 280.

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මූලික සැලැස්ම අංක ඒ. 4849.

පිහිටීම : කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ, මහරගම සුළු නගර සභාව තුළ ගංගොඩවිල චන්ද කොට්ඨාශ අංක 2.

කැබැල්ල : 1.

ඉඩමේ නම : රත්තනපිටියේ පාරේ වරිපනම් අංක 79 දවටගහ ලන්ද ; විස්තරය : කපරාදු කළ බිත්ති ඇති බෝමළුවද, ලී ගේට්ටු 2ද, කපරාදු කළ කාණුද, කපරාදු කළ ළිඳක්ද, කපරාදු කළ වතුර භාජනයක්ද, කපරාදු කළ ටැන්කියක්ද, කපරාදු කළ ටකරන් සෙවිලි ගොඩනැගිලි 5ක්ද, කපරාදු කළ ටකරන් සෙවිලි සාකළ කොටසක් සහිත කපරාදු කර උළු සෙවිලි ගෙයක්ද, අවු. 15-25 පොල්ගස් 46ක්ද, අවු. 3-5 බෝගස් 2ක්ද, අවු. 20-25 ක්වූ අඹගසක්ද, අවු. 15-18 ගොඩපරගස් 2ක්ද, අවු. 3-6 කජුගස් 4ක් ඇති වත්ත ; අයිතිකම් කියන අය : නුගේගොඩ ගංගොඩවිල පදිංචි ලීලා ජයසූරිය මහත්මිය, සහ සී. සී. පතිරාජ මහතා ; ප්‍රමාණය : අ. 2, රූ. 0, පර්. 08.0.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962 මැයි මස 22 වැනි දින පෙරවරු 10 ට කොළඹ කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද, 1962 මැයි මස 8 වෙනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. මේ සම්බන්ධයෙන් අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය ඔප්පු සහ අනෙකුත් ලියකියවිලි පරීක්ෂණයේදී මා වෙත ඉදිරිපත් කළ යුතුය.

වී. පී. ඒ. පෙරේරා,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ අතිරේක ඒජන්තතුමා.

වර්ෂ 1962 ක්වූ මාර්තු මස 2 දින,
කොළඹ කච්චේරියේදීය.

3-537

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥාපණතින් සංශොධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

අංකය. 3/41/104.

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥාපණතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

අංක පී.පී.ඒ. 2877 දරණ සැලැස්ම ගම : පමුණුව.

කැබැලි 1.

ඉඩමේ නම : වැලිපැලේ කුඹුර ; විස්තර : කුඹුර ; අයිතිකම් කියන්නා : මාතලේ, උඩුගම වලව්වේ, උඩුගම කුමාරිහාමි ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 07.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962 අප්‍රේල් මස 25 වැනි දින අ. භා. 2.00 ට මාතලේ කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1962 අප්‍රේල් මස 18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ජේ. සු. බ. අදිකාරම්,
මාතලේ දිස්ත්‍රික්කයෙය් රජයට ඉඩම් අත්කර ගන්නා නිලධාරි.

1962 මාර්තු මස 1 වැනි දින,
මාතලේ කච්චේරිය.

3-535

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥාපණතින් සංශොධිත වූ 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

අංකය. 3/41/93

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥාපණතින් සංශොධිත වූ. 1950හේ අංක 9 දරණ ඉඩම ලබාගැනීමේ ආඥාපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:—

මූලික සැලැස්මේ අංකය ඒ. 2875—ගම: පිටකන්ද

**බිම් කට්ටිය: 1.**

නම: නාකන්දේ ඇල්ලේවත්ත නොහොත්, බතගෙහේන; විස්තර: අවුරුදු 20 ට වැඩි තේ, අවු: 10 වූ රබර් ගස් 20 ක් ද, අවුරුදු 12 සිට 20 දක්වා වූ කොස් ගස් 3 ක් සහ තේ පැළ 662 ද ඇති ඉඩම; අයිතිකම් කියන්නාගේ නම: කහිකාවල, අලකොලඹ, උක්කුරාල ගමරාල ගෙදර විජේසූරිය පුන්චි බණ්ඩා; ප්‍රමාණය: අ. 0, රූ. 3, ප. 18.8.

**බිම් කට්ටිය: 2.**

නම: මැදගෙදරවත්ත නොහොත්, බත්ගෙවත්ත; විස්තර: අවුරුදු 30 වූ කොස් ගස් 8 ක් ද, අවුරුදු 10 වූ දෙල් ගස් 1 ක් ද, අවුරුදු 10 වූ රබර් ගස් 8 සහ අවු. 3 ක් වූ සියඹලා ගස් 2 ද ඇති වත්ත; අයිතිකම් කියන්නාගේ නම: අල්වත්ත, පිටකන්දේ, තෙන්නකෝන් ගෙදර රත්මැණිකා; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 29.2.

**බිම් කට්ටිය 3.**

නම: මැදගෙදරවත්ත නොහොත්, බත්ගෙවත්ත; විස්තර: අවුරුදු 20 ට වැඩි තේ, අවු: 10 වූ රබර් ගස් 21 ද, අවු: 12 වූ දෙල් ගස් 3 ද, අවු: 20 වූ කොස් ගස් 1 ද, අවු: 4 වූ කිතුල් ගස් 8 ද, අවු: 3 සිට 5 දක්වා වූ පුවක් ගස් 25 ද, අවු: 3 වූ කොකෝවා ගස් 10 ද, අවු: 15 වූ පුළුන් ගස් 2 සහ තේ පැළ 343 ක් ඇති ඉඩම; අයිතිකම් කියන්නාගේ නම: අල්වත්ත, පිටකන්දේ, තෙන්නකෝන් ගෙදර කිරිබන්ඩා; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 31.3.

**එකතුව: අ. 1, රූ. 0, ප. 39.3.**

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962 අප්‍රේල් මස 25 වැනි දින පූ. භා. 10.00 ට මාතලේ කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1962 අප්‍රේල් මස 18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණින් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ජේ. සු. බ. අදිකාරම්,
මාතලේ දිස්ත්‍රික්කයේ රජයට ඉඩම් අත්කර ගන්නා නිලධාරී.

1962 මාර්තු මස 1 වැනි දින,
මාතලේ කච්චේරිය.

3-534

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතෙන් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

ඒ. කිහු/14.

පොදු කටයුත්තක් සඳහා පහත විස්තර දැක්වෙන ඉඩම ආණ්ඩුවට ගැනීමට අදහස් කරන බැව් 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතෙන් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:—

මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ ඉරුක්කලම්පිඩි ගම්මුලාදෑනි වසමේ ඉරුක්කලම්පිඩි ගමේ පිහිටි මූලික සිතියම් අංක පී.සී.ඒ. 2,238 වශයෙන් පෙන්නුම් කරන කොන්තක් කසිකාඩු නොහොත් ඊබ්‍රහිම් කොල්ලෙයි තෝට්ටම් නමැති ඉඩම.

**කැබලි අංකය: 1.**

ඉඩමේ නම: කොන්තක් කසිකාඩු නොහොත් ඊබ්‍රහිම් කොල්ලෙයි තෝට්ටම්; විස්තර: අවුරුදු 5-15ක් වයසැති තල් ගස් 9කින් යුත් ලඳුකැලෑවකි; උරුමක්කාරයෝ: ඉරුක්කලම්පිඩි ගමේ විසූ, මියගිය මොහිඩීන් සීනි මරික්කාර්ගේ උරුමක්කාරයින් සහ එම ගමේ එම්. කසිම් මොහොමමදු ද රජයද උරුමක්කාරයෝ වෙති.

**ප්‍රමාණය: අක්කර 1, රූ. 2, ප. 20.**

(2) ඉහත සඳහන් ඉඩමට අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962 මාර්තු 3 වැනි දින පූ.භා. 10ට මන්නාරම කච්චේරියේදී මා ඉදිරියේ පෙනී සිටිය යුතුයි. තවද 1962 අප්‍රේල් 25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත්, එකී ඉඩම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණින් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එන්. පී. ජෙගනාදන්,
මන්නාරම් දිස්ත්‍රික්කයේ දිසාපති.

1962 මාර්තු 9 වැනිදා,
මන්නාරම කච්චේරියේදිය.

3-436

## 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනත

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

සඳහන් අංකය: 3/64/37-ජේ54/එච්ඩී 424.

මහජන කාය්‍යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩම්වල විස්තර:—අංක 217 දරණ අ. ශ.සැ. 3 වෙනි අතිරේකය—වයඹ පලාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත්පත්තුවේ, නැගෙනහිර මැදපත්තු කෝරලේ, වත්තේගෙදර ගමේ.

**අංකය: 39.**

ඉඩමේ නම: පිංකුඹුර; විස්තරය: කුඹුර; අයිතිකරුගේ නම: පී. දේවානන්ද ස්ථවිර, එන්නොරුව පන්සල නක්කාවත්ත; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 03.1.

**අංකය: 40.**

ඉඩමේ නම: පිංකුඹුර; විස්තරය: මුඩු බිම; අයිතිකරුගේ නම: පී. දේවානන්ද ස්ථවිර, එන්නොරුව පන්සල, නක්කාවත්ත; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 02.1.

**එකතුව අ. 0, රූ. 0, ප. 05.2.**

අත්කර ගැනීමට අදහස් කරන ඉහතකී ඉඩම්වලට සම්බන්ධතාවක් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1962 මැයි මස 7 දින ප. ව. 2.30 ට කුරුණෑගල කච්චේරියේ දී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම් පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම් පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණින් බැලීම සම්බන්ධ විස්තර ද 1962 මැයි 1 වෙනි දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

ඇම්. ඇල්. ජේ. වික්‍රමරත්න,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත.

1962 මාර්තු මස 7 දා,
කුරුණෑගල කච්චේරිය.

3-425

## ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

එල්. බී/ඩබ්ලිව් 675.

**මහනුවර දිස්ත්‍රික්කයේ, රේවියගම පිහිටි කුඩුම්රිස්කැටිය නමැති රජයේ ඉඩමෙහි එනසාල් වගාවේ ප්‍රයෝජනය ගැනීමේ බද්ද වෙන්දේසි කිරීම**

මෙහි පහත දක්වන උප ලේඛනයෙහි සඳහන් රජයේ ඉඩමේ ඇති එනසාල් වගාව, 1962 මැයි මස 1 වැනි දින සිට 1963 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලසීමාවේදී භුක්ති විඳීමේ බද්ද, මහනුවර දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා (මේ සඳහා මින් ඉදිරියට දිසාපතිතුමා යන්න පමණක් යෙදෙන අතර, වෙන්දේසිය කිරීම පිණිස එකී දිසාපතිතුමා විසින් බලය පවරනු ලබන වෙන යම් නිලධාරියෙක් වුවත් නම්, ඔහුද ඇතුළත්වේ) විසින්, තෙල්දෙනියේ ප්‍රාදේශීය ආදායම් නිලධාරිතුමාගේ කාය්‍යාලයේදී 1962 අප්‍රේල් මස 11 වැනි දින පෙ. ව. 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. වෙන්දේසිය සඳහා ලංසුව වශයෙන් තබන බදු මුදල රු. 500ක් වන අතර, ඉල්ලීම් කළයුත්තේ එකී ලංසුවේ ගණනේ සිටය. ලංසු වෙන් පහත ඉල්ලීමක් භාරගනු නොලැබේ.

3. දිසාපතිතුමා, යම් ඉල්ලීමක් භාරගැනීමට පෙර, එම ඉල්ලීමේ සත්‍යතාවය ගැනත්, ඉල්ලුම්කරුට බද්දේ කොන්දේසි පිළිපැදීමේ

හැකියාව තිබීම ගැනත්, සලකා බලනු ඇත. එසේ යම් ඉල්ලීමක් ඔහුගේ සිතට එකඟ නොවුනි නම් එම ඉල්ලීම ප්‍රතික්ෂේපකර එවැනි ඉල්ලීමක් ඇති නොවූ අයුරින් වෙන්දේසිය ගෙනයනු ඇත.

4. සෑම ඉල්ලුම්කරුවෙක්ම තමන් හෝ තමා වෙනුවෙන් බලය පැවරූ ඒජන්ත කෙනෙක් මගින් වෙන්දේසියට පැමිණ සිටිය යුතුය. බලය පිට පැමිණෙන ඒජන්තවරු වෙන්දේසිය පටන්ගන්නට මත්තෙන් තම බලකඩදාසිය දිසාපතිතැනගේ බලාගැණීම පිණිස ඉදිරිපත් කළයුතුය.

5. බද්ද ඉහළම මිළට ඉල්ලන අය ඔහුගේ ඉල්ලීම භාරගනු ලැබූ වහා ඔහු ඉල්ලූ ගණනින් භාගයක් දිසාපතිතැනට ගෙවිය යුතුය. ඉතිරි භාගය එදින සිට සති දෙකක් ඇතුළතදී ගෙවියයුතු වේ. ඉහළම මිළට ඉල්ලූ අය එම ගණනින් භාගයක් ඒ වහා නොගෙව්වොත් හෝ ඉතිරි මුදල එදින සිට සති දෙකක් ඇතුළතදී නොගෙව්වොත් වෙන්දේසිය අවලංගුකිරීමට හා එම අය බද්ද වෙනුවෙන් ගෙවා ඇති යම් මුදලක් වේ නම් එය රාජසන්තක කිරීමට දිසාපතිතැනට බලය ඇත.

6. දිසාපති තැන වුවමනා කළහොත් ඉහලම මීළට ඉල්ලන අය ඇප මුදලක් තැන්පත් කළයුතු වේ. මෙම මුදල එම අය ඉල්ලූ ගණනින් සියයට 10 ට වැඩි නොවනු ඇත.

7. ඉහළම මිළට ඉල්ලූ අයට ඉඩමේ භුක්තිය භාරදෙනු ලබන්නේ ඔහු ඉල්ලූ සම්පූර්ණ මුදලම ගෙවූ විටය. ඉන් අනතුරුව ඔහු නමින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ. මෙම බලපත්‍රයට, වෙනත් කොන්දේසි අතර, පහත සඳහන් කොන්දේසි අඩංගු වනු ඇත :—

(අ) ඕනෑම අවස්ථාවක, මාසයක කල්දීමේ දැන්වීමක් බලපත්‍රකරුට පුද්ගලිකව භාරදී හෝ ඔහු/ඈ අන්තිමට සිටියායයි දැනෙන ලිපිනයට ලියා පදිංචිකළ තැපැලෙන් යැවීමෙන් හෝ ඉඩමේ පෙනෙන තැනෙක සවිකිරීමෙන්, බද්ද අවලංගු කළහැකි වේ.

(ආ) බද්ද බලපත්‍රකරුට පුද්ගලික වේ.

(ඇ) බලපත්‍රකරු, බලපත්‍රය පිට තමාට ඇති අයිතිය වෙනත් අයෙකුට දීමක්, පැවරීමක්, උගස්කිරීමක් හෝ වෙන අන්දමකින් අන්සතු කිරීමක්, නොකළ යුතුය.

(ඈ) බලපත්‍රකරු, දිසාපතිතැනගෙන් කලින් ලබාගත් ලියවිල්ලක අවසරය නොමැතිව ඉඩමේ කිසිම ස්ථිර හෝ අර්ධ ස්ථිර ගොඩනැගිල්ලක් හෝ ස්ථිර වැව්ල්ලක් නොකළ යුතුය.

(ඉ) බලපත්‍රකරු, දිසාපතිතැනගෙන් කලින් ලබාගත් ලියවිල්ලක අවසරය නොමැතිව ඉඩමේ වැවෙන ගස් කිසිවක් කැපීමක්, ඒවාට කිසිම අලාභයක් සිදුකිරීමක්, හෝ එසේ කැපීමට හෝ අලාභ සිදුකිරීමට ඉඩදීමක්, නොකළ යුතුය.

(ඊ) බලපත්‍රකරු, ඉඩම ශුඩකිරීමක්, එහි වල් නෙලීමක්, පස් කැපීමක් හෝ ඇවිස්සීමක් හෝ කිසි අන්දමකින් ඉවත් කිරීමක් හෝ නොකළයුතුය.

(උ) ඉඩම සම්බන්ධයෙන් පිටට ගෙවියයුතු වරිපනම් ආදී සියළුම බදු, බලපත්‍රකරු විසින් ගෙවිය යුතුය.

(ඌ) බලපත්‍රයට අයත් කොන්දේසි කඩකිරීමක් වුනි නම්, දිසාපතිතැනගේ නියෝගය පිට කිසිම වන්දියක් නොගෙවා බලපත්‍රය අවලංගු කළහැකි වේ.

(එ) බලපත්‍රකරුට, ඉඩමේ වැඩි දියුණුකිරීමක් හෝ තමන් ඉඩම වෙනුවෙන් කළ වියදමක් හෝ වෙන යම් කිසි කරුණක් සම්බන්ධයෙන් හෝ කිසිම වන්දියක් හෝ ගෙවීමක් ඉල්ලීමේ අයිතියක් ඇති නොවේ.

(ඒ) බලපත්‍රකරුට, මෙම බලපත්‍රය ගෙන තිබීමේ හේතුව පිට ඉඩම අනුග්‍රාහිකව බද්දකට හෝ මිළයට ලබාගැණීමේ අයිතිවාසිකමක් ඇති නොවේ.

ඩී. කේ. ඇහැලේපොල,
මහනුවර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1962 මාර්තු මස 9 වැනි දින,
මහනුවර කච්චේරියේ දීය.

## උපලේඛනය

මහනුවර දිස්ත්‍රික්කයේ, මැදදුම්බර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, රේජියගම පිහිටි, අක්කර 50 ක් පමණ බිම්ප්‍රමාණය ඇති, කුඩුම්රිස්කැටිය නම්වූ, පහත සඳහන් මායිම් ඇතුළත පිහිටියාවූ, රජයේ ඉඩම :—

උතුරට : ලියන්ගහපැලේ ඇල ; නැගෙණහිරට : ගම්කායෑ සහා පාර සහ අඟුරුවැල්ල වත්ත ; දකුණට බර්න්සයිඩ් තේ වත්ත, හා ; බස්නාහිරට : ලියන්ගහපැලේ ඇල.

3-429

---

අංකය : එල්.බී/ඩබ්ලිව්. 682.

## මහනුවර දිස්ත්‍රික්කයේ රේජියගම පිහිටි කොරටුවකැලේ නමැති රජයේ ඉඩමෙහි එනසාල් වගාවේ ප්‍රයෝජනය ගැණීමේ බද්ද වෙන්දේසි කිරීම

මෙහි පහත දක්වන උපලෙඛනයෙහි සඳහන් රජයේ ඉඩමේ ඇති එනසාල් වගාව, 1962 මැයි මස 1 වැනි දින සිට 1963 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලසීමාවේදී භුක්ති විඳීමේ බද්ද, මහනුවර දිස්ත්‍රික්කයේ දිසාපතිතැන (මේ සඳහා මින් ඉදිරියට දිසාපතිතැන යන්න පමණක් යෙදෙන අතර, වෙන්දේසිය කිරීම පිණිස එකී දිසාපතිතැන විසින් බලය පවරනුලබන වෙන යම් නිලධාරියෙක් වුනි නම් ඔහුද ඇතුළත්වේ) විසින්, තෙල්දෙනියේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කායඝාලයේදී 1962 අප්‍රේල් මස 11 වැනි දින පෙ. ව. 9.30ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. වෙන්දේසිය සඳහා ලංසුව වශයෙන් තබන බදු මුදල රු. 600ක් වන අතර, ඉල්ලීම් කළයුත්තේ එකී ලංසුවේ ගණනේ සිටය. ලංසුවෙන් පහත ඉල්ලීමක් භාරගනු නොලැබේ.

3. දිසාපතිතැන, යම් ඉල්ලීමක් භාරගැනීමට පෙර, එම ඉල්ලීමේ සත්‍යතාවය ගැනත්, ඉල්ලුම්කරුට බද්දේ කොන්දේසි පිළිපැදීමේ හැකියාව තිබීම ගැනත්, සලකා බලනු ඇත. එසේ යම් ඉල්ලීමක් ඔහුගේ සිතට එකැඟ නොවුනි නම් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර එවැනි ඉල්ලීමක් ඇති නොවූ අයුරින් වෙන්දේසිය ගෙනයනු ඇත.

4. සෑම ඉල්ලුම්කරුවෙක්ම තමන්ම හෝ තමා වෙනුවෙන් බලය පැවරූ ඒජන්ත කෙනෙක් මගින් වෙන්දේසියට පැමිණ සිටිය යුතුය. බලය පිට පැමිණෙන ඒජන්තවරු වෙන්දේසිය පටන්ගන්නට මත්තෙන් තම බලකඩදාසිය දිසාපතිතැනගේ බලාගැනීම පිණිස ඉදිරිපත් කළයුතුය.

5. බද්ද ඉහළම මිළට ඉල්ලන අය ඔහුගේ ඉල්ලීම භාරගනු ලැබූ වහා ඔහු ඉල්ලූ ගණනින් භාගයක් දිසාපතිතැනට ගෙවිය යුතුය. ඉතිරි භාගය එදින සිට සති දෙකක් ඇතුළත දී ගෙවිය යුතු වේ. ඉහළම මිළට ඉල්ලූ අය එම ගණනින් භාගයක් ඒ වහා නොගෙව්වොත් හෝ ඉතිරි මුදල එදින සිට සති දෙකක් ඇතුළතදී නොගෙව්වොත් වෙන්දේසිය අවලංගු කිරීමට හා එම අය බද්ද වෙනුවෙන් ගෙවා ඇති යම් මුදලක් වේ නම් එය රාජසන්තක කිරීමට දිසාපතිතැනට බලය ඇත.

6. දිසාපතිතැන වුවමනා කළොත් ඉහළම මිලට ඉල්ලන අය ඇප මුදලක් තැන්පත් කළ යුතු වේ. මෙම මුදල එම අය ඉල්ලූ ගණනින් සියේට 10 කට වැඩි නොවනු ඇත.

7. ඉහළම මිලට ඉල්ලූ අයට ඉඩමේ භුක්තිය භාරදෙනු ලබන්නේ ඔහු ඉල්ලූ සම්පූර්ණ මුදලම ගෙවූ විටය. ඉන් අනතුරුව ඔහු නමින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ. මෙම බලපත්‍රයට, වෙනත් කොන්දේසි අතර, පහත සඳහන් කොන්දේසි අඩංගු වනු ඇත :—

(අ) ඕනෑම අවස්ථාවක, මාසයක කල්දීමේ දැන්වීමක් බලපත්‍රකරුට පුද්ගලිකව භාරදී හෝ ඔහු/ඈ අන්තිමට සිටියායයි දැනෙන ලිපිනයට ලියා පදිංචිකළ තැපැලෙන් යැවීමෙන් හෝ ඉඩමේ පෙනෙන තැනෙක සවිකිරීමෙන්, බද්ද අවලංගු කළහැකි වේ.

(ආ) බද්ද බලපත්‍රකරුට පුද්ගලික වේ.

(ඇ) බලපත්‍රකරු, බලපත්‍රය පිට තමාට ඇති අයිතිය වෙනත් අයෙකුට දීමක්, පැවරීමක්, උගස්කිරීමක් හෝ වෙන අන්දමකින් අන්සතු කිරීමක්, නොකළ යුතුය.

(ඈ) බලපත්‍රකරු, දිසාපතිතැනගෙන් කලින් ලබාගත් ලියවිල්ලක අවසරය නොමැතිව ඉඩමේ කිසිම ස්ථිර හෝ අර්ධ ස්ථිර ගොඩනැගිල්ලක් හෝ ස්ථිර වැව්ල්ලක් නොකළ යුතුය.

(ඉ) බලපත්‍රකරු, දිසාපතිතැනගෙන් කලින් ලබාගත් ලියවිල්ලක අවසරය නොමැතිව ඉඩමේ වැවෙන ගස් කිසිවක් කැපීමක්, ඒවාට කිසිම අලාභයක් සිදුකිරීමක්, හෝ එසේ කැපීමට හෝ අලාභ සිදුකිරීමට ඉඩදීමක්, නොකළ යුතුය.

(ඊ) බලපත්‍රකරු, ඉඩම ශුද්ධ කිරීමක්, එහි වල් නෙලීමක්, පස් කැපීමක් හෝ ඇවිස්සීමක් හෝ කිසි අන්දමකින් ඉවත් කිරීමක් හෝ නොකළ යුතුය.

(උ) ඉඩම සම්බන්ධයෙන් පිටට ගෙවිය යුතු වරිපනම් ආදී සියළුම බදු, බලපත්‍රකරු විසින් ගෙවිය යුතුය.

(ඌ) බලපත්‍රයට අයත් කොන්දේසි කඩකිරීමක් වුනි නම්, දිසාපතිතැනගේ නියෝගය පිට කිසිම වන්දියක් නොගෙවා බලපත්‍රය අවලංගු කළහැකි වේ.

(එ) බලපත්‍රකරුට, ඉඩමේ වැඩි දියුණුකිරීමක් හෝ තමන් ඉඩම වෙනුවෙන් කළ වියදමක් හෝ වෙන යම් කිසි කරුණක් සම්බන්ධයෙන් හෝ කිසිම වන්දියක් හෝ ගෙවීමක් ඉල්ලීමේ අයිතියක් ඇති නොවේ.

(ඒ) බලපත්‍රකරුට, මෙම බලපත්‍රය ගෙන තිබීමේ හේතුව පිට ඉඩම අනුග්‍රාහිකව බද්දකට හෝ මිළයට ලබාගැණීමේ අයිතිවාසිකමක් ඇති නොවේ.

ඩී. කේ. ඇහැලේපොල,
මහනුවර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1962 මාර්තු මස 9 වැනි දින,
මහනුවර කච්චේරියේ දීය.

## උපලෙඛනය

මහනුවර දිස්ත්‍රික්කයේ, මැදදුම්බර ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ, රේජියගම පිහිටි අක්කර 73, රූඩ් 0, පර්චස් 18 ක් බිම් ප්‍රමාණය ඇති, කොරටුවකැලේ නම්වූද, අංක 8,758 පිඹුරේ කට්ටි අංක 2, 3 හා 4 වශයෙන් වඩාත් විස්තරව දක්වන්නාවූද, රජයේ ඉඩම.

3-431

ලංකාවේ වැලවේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි